8.1.11 එසේම පැමිණිල්ල ඉදිරිපත් කරන විට එය ඉදිරිපත් කරන අය සිය අනන්‍යතාව සහිතව පැමිණිල්ල ඉදිරිපත් කළ යුතු අතර නිර්නාමිකව ඉදිරිපත් කරන පැමිණිලි ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කෙරේ.

8.1.12 කෙටි නාට්‍ය තරගය සඳහා තෝරා ගනු ලබන නාට්‍ය පිළිබඳ යම් අයිතිවාසිකමක් හෝ විරෝධයපෑමක් සිදු කරන්නේ නම් එය දිවුරුම් ප්‍රකාශයක් මගින් විධිමත්ව සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතුය

8.1.13 ඉහත 8.1.13 , 8.1.14 යන වගන්ති ප්‍රකාරව ලැබුණු පැමිණිල්ලක හෝ අයිතිවාසිකම් පෑමක හෝ විරෝධය පෑමක සාධාරණභාවය පිළබඳ සෑහීමට පත් විය හැකි අවස්ථාවල සම්මාන ප්‍රදානෝත්සවයෙන් පසුව වුවත් අදාල නාට්‍යය / නාට්‍ය සම්පූර්ණයෙන් තරගයෙන් ඉවත් කිරීමට, ලබා දුන් සම්මාන , සහතික පත්‍ර සහ ත්‍යාග නැවත අය කර ගැනීමටත් අමාත්‍යාංශ ලේකම්ට හෝ අධිකාරිය පැවරුණු මාණ්ඩලික නිලධාරියකුට හෝ බලය ඇත.

8.1.14 නොවැළැක්විය හැකි හේතුන් මත හෝ ප්‍රමාණවත් අත්පිටපත් සංඛ්‍යාවක් නොලැබීම මත හෝ ඉදිරිපත් වී ඇති නාට්‍ය ගුණාත්මක භාවයෙන් දුර්වලවීම මත හෝ අවස්ථානුගත හේතුන් මත මෙම නාට්‍ය තරගය නොපැවැත්වීමට , කල් දැමීමට සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට තීරක බලය ඇත.

8.1.15 කෙටි නාට්‍ය අත්පිටපත් A4 ප්‍රමාණයේ කඩදාසිවල තනි පැත්තේ පරිගණක (ටයිප්කර) ගතකර තිබිය යුතුය. එම අත් පිටපත් පරිගණක ගත කළ යුත්තේ අක්ෂරයේ ප්‍රමාණය ඒකක 12 ය.

## **8.2** <u>කෙටි නාට්‍ය තරඟ සඳහා පිරිනමන මුදල් තිළිණ හා සම්මාන</u>

| අනු අංකය | සම්මාන | ත්‍යාග මුදල් (රු) |
|---|---|---|
| 8.2.1 | වසරේ ප්‍රශස්තම පසුතල නිර්මාණය | 10,000.00 |
| 8.2.2 | වසරේ ප්‍රශස්තම රංග වස්ත්‍ර නිර්මාණය | 10,000.00 |
| 8.2.3 | වසරේ ප්‍රශස්තම සංගීත නිර්මාණය | 10,000.00 |
| 8.2.4 | වසරේ ප්‍රශස්තම රංග වින්‍යාසය | 10,000.00 |
| 8.2.5 | වසරේ ප්‍රශස්තම අංග රචනය | 10,000.00 |
| 8.2.6 | වසරේ ප්‍රශස්තම වේදිකා පරිපාලනය | 10,000.00 |
| 8.2.7 | වසරේ ප්‍රශස්තම රංගාලෝකකරණය | 10,000.00 |
| 8.2.8 | වසරේ ප්‍රශස්තම කෙටි නාට්‍ය සහය නිළිය | 10,000.00 |
| 8.2.9 | වසරේ ප්‍රශස්තම කෙටි නාට්‍ය සහය නළුවා | 10,000.00 |
| 8.2.10 | වසරේ ප්‍රශස්තම කෙටි නාට්‍ය නිළිය | 15,000.00 |
| 8.2.11 | වසරේ ප්‍රශස්තම කෙටි නාට්‍ය නළුවා | 15,000.00 |
| 8.2.12 | ජූරියේ විශේෂ සම්මානය ( උපරිම 2 යි ) | 5,000.00 බැගින් |
| 8.2.13 | කෙටි නාට්‍ය රචනය තෙවන ස්ථානය | 10,000.00 |
| 8.2.14 | කෙටි නාට්‍ය රචනය දෙවන ස්ථානය | 15,000.00 |
| 8.2.15 | වසරේ ප්‍රශස්තම කෙටි නාට්‍ය රචනය ප්‍රථම ස්ථානය | 20,000.00 |
| 8.2.16 | කෙටි නාට්‍ය අධ්‍යක්ෂණය තෙවන ස්ථානය | 10,000.00 |
| 8.2.17 | කෙටි නාට්‍ය අධ්‍යක්ෂණය දෙවන ස්ථානය | 15,000.00 |
| 8.2.18 | වසරේ ප්‍රශස්තම කෙටි නාට්‍ය අධ්‍යක්ෂණය ප්‍රථම ස්ථානය | 20,000.00 |
| 8.2.19 | වසරේ විශිෂ්ටතම කෙටි නාට්‍ය | 20,000.00 |

